


# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන
18 වැනි කාණ්ඩය
දෙසැම්බර් 2021

01 නව පාර්ලිමේන්තු සභාවාරය ජනවාරි 18 වැනිදා

03 ග්‍රාමීය අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලුව විසඳීමට පියවර - අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා

11 නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ කාරක සභා ක්‍රමය

17 විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය ස්වාධීනත්වය සුරකිමින් පරිපාලනමය හා ප්‍රතිපාදනමය මැදිහත්වීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මුල් විය යුතුයි - කෝප් කමිටුව

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව



# නව පාර්ලිමේන්තු සභාවාරය ජනවාරි 18 වැනිදා

**අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් දෙසැම්බර් 12 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව එතුමාට පැවරී ඇති බලතල අනුව පාර්ලිමේන්තුව වාරාවසාන කරන ලද අතර නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය ලබන ජනවාරි 18 වැනිදා පූර්වභාග 10.00 ට ආරම්භ කරන ලෙස ප්‍රකාශයට පත් කර ඇත.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ එක් සභාවාරයක් අවසන්කර නව සභාවාරයක් ආරම්භ කරන අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කර මුලසුන දරමින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමටද අවස්ථාව හිමිවෙයි.

පාර්ලිමේන්තුව වාරාවසාන කළ විට එතෙක් යථා පරිදි පාර්ලිමේන්තුව විසින් සලකා නොබලන ලද ප්‍රශ්න සහ යෝජනා අහෝසි වන අතර මන්ත්‍රීවරුන් නැවත වාරයක් ඒ සම්බන්ධව ස්ථාවර නියෝග අනුව කටයුතු කළ යුතුය. තවද පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබද කාරක සභාව හා විශේෂ කාරක සභා හැර අනෙකුත් සියලු කාරක සභා නව සභාවාරයේදී නැවත පත්කළ යුතුය.

> “ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව පාර්ලිමේන්තුව වාරාවසාන කරන ලද අතර නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය ලබන ජනවාරි 18 වැනිදා පූර්වභාග 10.00ට ආරම්භ කරන ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ”

මේ අනුව පසුගිය 09 වැනිදා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ පරිදි ජනවාරි 11 වැනි දින පාර්ලිමේන්තුව රැස් නොවන අතර ජනවාරි 18 වැනි දින නව වසරේ පාර්ලිමේන්තු රැස්වීම් ආරම්භ කරනු ලැබේ.

**පුවත්**

# ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ජනපති ප්‍රධානත්වයෙන් රැස් වෙයි.

**ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පසුගියදා (07) පස්වරුවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේදී රැස්වීය.**



ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිවරයා වශයෙන්, මෙම අවස්ථාවට සහභාගී වීම සඳහා පාර්ලිමේන්තුවට පැමිණි ජනාධිපතිතුමා, සභානායක අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු යන මහත්වරුන් ඇතුළු මැති ඇමතිවරුන් විසින් පිළිගනු ලැබිණි.





රටේ ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය, වර්තමානයේ ආරක්ෂක අංශවල අවධානය යොමු වී ඇති කරුණු හා අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා ඇතුළු අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉදිරිපත් කළ ගැටලු සහ යෝජනා රැසක් මෙහිදී සාකච්ඡාවට ලක්විය.



පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න, ත්‍රිවිධ හමුදාපතිවරු සහ පොලිස්පතිතුමා ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශය යටතට අයත් ආයතනවල නිලධාරීහු මෙම අවස්ථාවට එක්ව සිටියහ.







පුවත්

# ග්‍රාමීය අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලුව විසඳීමට පියවර - අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා



**ග්‍රාමීය අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලුව විසඳීම සඳහා " ඔබට ගෙයක්-රටට හෙටක්" නිවාස වැඩසටහන යටතේ සෑම වසරකම දිවයිනේ ග්‍රාම නිලධාරී වසම් 14022 ම ආවරණය වන පරිදි එක ගමකට එක් ගෙයක් බැගින් ඉදිකිරීමට රජය අපේක්ෂා කරන බවත් 2024 වර්ෂය වන විට මෙම වැඩසටහන මඟින් ඉදිකිරීමට නියමිත මුළු නිවාස සංඛ්‍යාව 71110ක් බවත් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පසුගිය දෙසැම්බර් 06 පාර්ලිමේන්තුවේදී පැවසීය.**

ඒ මහතා මේ බව සඳහන් කළේ 2022 අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවේ නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදයට එක්වෙමිනි.

එමෙන්ම, නාගරික අඩු පහසුකම් ජනාවාස වෙනුවෙන් 2024 වන විට නිවාස 50,000ක් සාදා නිම කිරීමට අපේක්ෂිත අතර, මේ වන විට නිවාස ඒකක 14,083ක ඉදිකිරීම් අවසන් කර ජනතාවට ලබා දීමට රජය කටයුතු කර තිබේ. ඒ අනුව 2024 වන විට කොළඹ ප්‍රදේශයේ පවතින අඩු පහසුකම් ජනාවාස නවීන මහල් නිවාස සංකීර්ණ බවට පත් කිරීම රජයේ අරමුණ වී තිබේ.

එයට අමතරව පසුබට නගර සංවර්ධනය කිරීම හා අලංකරණය කිරීම වෙනුවෙන් හඳුන්වා දුන් "සියක් නගර" ව්‍යාපෘතිය යටතේ නගර 117ක් අලංකරණය සඳහා තෝරා ගෙන ඇති බවත් 2022 වර්ෂයේදී තවත් නගර 100ක් මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇති බවත් මෙහිදී අග්‍රාමාත්‍යවරයා සඳහන් කළේය.

තවදුරටත් අදහස් දැක්වූ අග්‍රාමාත්‍යවරයා "අප මේ වන විට නගර සංවර්ධන සැලසුම් 21 ක් අවසන් කර තියනවා. තවත් නගර සැලසුම් 52ක් අවසන් කරමින් සිටිනවා. ඒ වගේම 2024 වර්ෂය වන විට තවත් නගර සංවර්ධන සැලසුම් 136 සකස් කිරීමට අපේක්ෂා කරනවා. 2022 වර්ෂයේ සිට වතු ප්‍රජාව සඳහා නිවාස 10,000ක් (දස දහසක්) ඉදිකිරීමේ ඉන්දියානු ආධාර වැඩසටහනද ආරම්භ කෙරෙන බව සතුටින් ප්‍රකාශ කළ යුතුයි.

එමෙන්ම, භික්ෂූන් වහන්සේලාගේ දෙමාපියන් වෙනුවෙන් ආරම්භ කළ "මිහිඳු නිවහන" නිවාස වැඩ සටහන යටතේ නිවාස 2000ක් ඉදි කිරීමට සැලසුම් කර තියනවා. මෙම වැඩ සටහනද සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කළ යුතු යැයිද සඳහන් කළේය.

අවතැන්වූවන් නැවත පදිංචි කිරීම වෙනුවෙන් නිවාස 6000ක් ඉදිකිරීමට සැලසුම් කොට ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ඉන්දියානු රජයේ ආධාර යටතේ නිවාස 4000ක් ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සැපයීමේ වැඩසටහන සාර්ථකව අවසන් කිරීමට හැකිවන බවද හෙතෙම වැඩිදුරටත් පැවසීය.

2022 වර්ෂයේ සිට ඉන්දියානු ආධාර යටතේ වතු ප්‍රජාව සඳහා නිවාස 10,000ක් ඉදිකිරීමේ වැඩසටහන ද නුදුරේදීම ඇරඹෙන බවද අග්‍රාමාත්‍යවරයා සභාවට දන්වා සිටියේය.



පුවත්

# 2022 විසර්ජන පනත් කෙටුම්පත තෙවැනිවර කියැවීම වැඩි ඡන්ද 93 කින් සම්මතයි

**විසර්ජන පනත් කෙටුම්පත තෙවැනිවර කියැවීම වැඩි ඡන්ද 93කින් පසුගිය 10 වැනිදා සම්මත විය. ඊට පක්ෂව ඡන්ද 157 ලැබුණු අතර, විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව 64කි. ඒ සඳහා ඡන්ද විමසීම පූර්වභාග. 06.05 ට පැවැත්විණි.**

මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා විසින් 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම (අයවැය කථාව) නොවැම්බර් මස 12 වැනි සිකුරාදා පැවැත්වූ, නොවැම්බර් 13 වැනිදා සිට 22 වැනිදා දක්වා දින 07ක් විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය පැවැත්විණ.

විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමද වැඩි ඡන්ද 93කින් ඉකුත් නොවැම්බර් 22 වැනිදා සම්මත විය. ඊට පක්ෂව ඡන්ද 153 ලැබුණු අතර, විපක්ෂව ලැබුණු ඡන්ද සංඛ්‍යාව 60 කි.

නොවැම්බර් 23 වැනිදා කාරක සභා අවස්ථාවේ විවාදය ආරම්භ වූ අතර, සෙනසුරාදා ද ඇතුළුව දෙසැම්බර් 10 දක්වා දින 16 ක් එම විවාදය පැවැත්විණ.

පුවත්

# ගෑස් ටැංකි පුපුරායෑම පිළිබඳව පාර්ශ්ව කිහිපයක අදහස් ලබාගැනීමට වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ විශේෂ රැස්වීමක්



**දින කිහිපයකට පෙර සිට අනපේක්ෂිතව සිදුවන ගෑස් ටැංකි පුපුරායෑම පිළිබඳ පාර්ශ්ව කිහිපයක අදහස් ලබා ගැනීමට සහ ඊට විසඳුම් විමසීමට වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ විශේෂ රැස්වීමක් පාර්ලිමේන්තුවේදී පසුගිය දෙසැම්බර් 01 වැනි දින පැවැත්වුණි.**

වෙළඳ අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම අමාත්‍යාංශ උපදේශක කාරක සභාව රැස් වූ අතර ගරු රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාද මෙම සාකච්ඡාවට සම්බන්ධ විය.

පාර්ලිමේන්තුවේදී විපක්ෂය ඉදිරිපත් කළ ප්‍රශ්න කිහිපයක් පිළිබඳව සහ තවත් පාර්ශ්ව කිහිපයක් සම්බන්ධකරගෙන මේ පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ මෙම විශේෂ රැස්වීම පැවැත්විණ.



මේ සඳහා වෙළඳ අමාත්‍යාංශය, සමූපකාර සේවා අලෙවි සංවර්ධන සහ පාරිභෝගික අමාත්‍යාංශය, තාක්ෂණ අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නිමයුම් රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, ලිට්රෝ ගෑස් සමාගම, ලාෆ්ස් ගෑස් සමාගම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය, ලංකා ඛනිජ තෙල් සංස්ථාව, බලශක්ති අමාත්‍යාංශය, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන රැසක් නියෝජනය කරමින් නිලධාරීහු සහභාගී වූහ. එසේම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය හිටපු මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ඩබ්ලිව්. ජයතිලක මහතා සහ මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කරන මහාචාර්ය ශාන්ත වල්පොලගේ මහතා සහ ඛනිජ තෙල් පිළිබඳ විශේෂඥ නිමල් ද සිල්වා මහතාද මෙම කාරක සභාවට සම්බන්ධ වූහ.

මෙහිදී විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා ප්‍රශ්න කිහිපයක් මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළ අතර හැකි ඉක්මනින් ලිඛිතව හෝ මේ සඳහා පිළිතුරු ලබාදෙන ලෙස සඳහන් කළේය.

එසේම මෙහිදී ගෑස් පුපුරා යෑමට අදාළව පැමිණ සිටි සියලු පාර්ශ්වවලින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගැනීම සිදුවිය.

ගෑස් සංයුතියේ වෙනස් කිරීම වත්මන් පුපුරායෑම් වලට බලපෑමක් කළේද යන්න ගැනද, උසස් ප්‍රමිතියෙන් යුතු උපාංග භාවිතයේ ඇති වැදගත්කමද, ගෑස්වල ගඳ සුවඳ පිළිබඳ පරීක්ෂාකර වාර්තාවක් ලබාගෙන ගෑස් වෙළඳපොලට නිකුත් කිරීම පිළිබඳවද, ජනාධිපතිවරයා විසින් පත්කරන ලද කමිටුවේ වාර්තා දෙසතියක් ඇතුළත ලබාගෙන එම නිර්දේශ ඉක්මනින් ක්‍රියාත්මක කිරීම පිළිබඳවද, මෙරටට ගෙන්වන ගෑස් රටට ඇතුළු කිරීමට පෙර නැව තුළදීම ප්‍රමිතිය පරීක්ෂා කිරීම පිළිබඳවද යම් යම් එකඟතාවයන්ට පැමිණීම මෙහිදී සිදු විය.

මෙම කාරක සභාව සඳහා විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල, ගරු අමාත්‍යවරුන් වන වාසුදේව නානායක්කාර, උදය ගම්මන්පිළ, නිමල් සිරිපාල ද සිල්වා, මහින්දානන්ද අලුත්ගමගේ යන මහත්වරු, ගරු රාජ්‍ය අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විශාල සංඛ්‍යාවක්ද සහභාගී වූහ.



**පුවත්**

# රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් 07 දෙනෙකුගේ සහ මහකොමසාරිස්වරයෙකුගේ පත්වීම් සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් 07 දෙනෙකුගේ සහ එක් මහකොමසාරිස්වරයෙකුගේ පත්වීම් සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමි වූ බව මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

කටුනායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (03) පැවැති මෙම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ දී පත් කිරීමට අනුමතිය ලබාදුන් ලේකම්වරුන් සහ මහකොමසාරිස්වරයාගේ නාමයන් මතු දැක්වේ.

**මාලදිවයිනේ මහකොමසාරිස්වරයා ලෙස ඒ. එම්. ජේ. සාදික් මහතාට අනුමැතිය ලබාදී ඇත.**

- **කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස කේ. එම්. එස්. ඩී. ජයසේකර මහත්මිය**
- **ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා**
- **ලේකම්, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ඒ. කේ. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. එන්. කේ. වීරසේකර මිය**
- **පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා**
- **ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එස්. ජී. විජයබන්දු මහතා**
- **ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ඉංජිනේරු කීර්ති රංජිත් අබේගුණවර්ධන මහතා**
- **ජයන්ත චන්ද්‍රසෝම මහතා, විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ජයන්ත චන්ද්‍රසෝම මහතා**

මෙම රැස්වීමට අමාත්‍යවරුන් වන දිනේෂ් ගුණවර්ධන, ඩග්ලස් දේවානන්දා, බන්දුල ගුණවර්ධන, උදය ගම්මන්පිල, කෙහෙළිය රඹුක්වැල්ල, රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ජෝන් සෙනෙවිරත්න, රිෂාඩ් බදියුදීන්, තලතා අතුකෝරල, ධර්මලිංගම් සිද්ධාර්ථන් යන මහත්ම මහත්මීහු සහභාගි වූහ.

**පුවත්**

# පැරණි මැතිවරණ ක්‍රමයට හෝ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම යෝග්‍ය බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී යෝජනා කරයි.







**මෙම වතාවට පමණක් සීමා වන පරිදි පැරණි මැතිවරණ ක්‍රමයට හෝ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම යෝග්‍ය බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී පසුගියදා (02) යෝජනා කළේය.**

එම පක්ෂය වෙනුවෙන් කාරක සභාවේදී සාක්ෂි දුන් රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා සඳහන් කළේ, පළාත් සභා මැතිවරණය දීර්ඝ කාලයක් තිස්සේ නොපැවැත්වීම හේතුවෙන් ගැටලු රැසක් මතුව ඇති බවයි. එහෙයින්, පළාත් සභා මැතිවරණය වහාම පැවැත්විය යුතුය යන්න සිය පක්ෂයේ මතය බවද හෙතෙම සඳහන් කළේය. එසේම ලබන වසරේ මුල් කාර්තුව තුළ මෙම මැතිවරණය පැවත්වා, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව උපරිමය 5500කට සීමා විය යුතු බවද රාජ්‍ය අමාත්‍යවරයා පවසා සිටියේය.

එසේම පළාත් පාලන ආයතනවල කාලය දීර්ඝ කිරීම සුදුසු නොවන බව පැවසූ අමාත්‍ය මහින්ද අමරවීර මහතා කාරක සභාවේදී එම ආයතනවල මන්ත්‍රී ධුර සංඛ්‍යාව අවම කළ යුතුය යන්න ජනතා මතය බවද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, මැතිවරණය පවත්වා නව සභිකයන් දිවුරුම් දෙන තෙක්, එම ආයතනවල බලය කොමසාරිස්වරයෙකු යටතට පැවරීමේ අවශ්‍යතාව අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා කාරක සභාවට පැහැදිලි කළේය.

පවතින නීතිය යටතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නොහැකිය යන්න නීතිපති මතය බවද ඒ සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ගෙන ආ යුතු බවද කාරක සභාවේ සභාපති, සභානායක අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මෙහිදී සඳහන් කළේය. පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්විය යුතුය යන්න කාරක සභාවේ පොදු මතය බවද සභාපතිවරයා සඳහන් කළේය.





මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේදී කොට්ඨාසවලින් පත්වන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සියයට 60ක් වීම, සමානුපාතිකව තෝරා ගනු ලබන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සියයට 40ක් වීම මැතිවරණ වියදම් සීමා කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැකසීම.

සියලු තලයන්හි කාන්තා නියෝජනය ඉදිරිපත් කරනු ලබන අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට 25ක් වීම ද අවධාරණය කරන ලදී. මැතිවරණ වියදම් සීමා කිරීමට ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම ප්‍රශංසනීය වේ.



එමෙන්ම මැතිවරණ කාල සීමාව තුළ ජනමාධ්‍යයේ හැසිරීම නියාමනය කළ යුතුය. විශේෂයෙන් සමාජ මාධ්‍ය හැසිරීම නියාමනය වැදගත් බවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කාරක සභාවේදී අවධාරණය කළේය.

මැතිවරණ හා ඡන්ද විමසීම් නීති රීති ප්‍රතිසංස්කරණයට ඉදිරිපත් වූ යෝජනා විශ්ලේෂණය කිරීමේ විද්වත් කමිටුවේ සභාපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා කාරක සභාවේදී සඳහන් කළේ 70:30 අනුපාතයට අනුව නව මැතිවරණ ක්‍රමය සකසන්නේ නම්, පළාත් පාලන ආයතනවල දැනට පවතින සභිකධූර සංඛ්‍යාව 1500 කින් අඩුකළ හැකි බවයි. පළාත් පාලන බල ප්‍රදේශය ජයග්‍රහණය කරන දේශපාලන පක්ෂයට ප්‍රසාද ආසන 02ක් ලැබෙන පරිදි මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවද මහාචාර්යවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, දුමින්ද දිසානායක යන මහත්වරුද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මෙම කාරක සභා රැස්වීමට සහභාගි වූහ.



කාරක සභාවේ සාමාජිකයන් ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන එම්. ඒ. සුමන්තිරන්, මධුර විතානගේ සහ සාගර කාරියවසම් යන මහත්වරුද සහභාගි වූහ.

මැතිවරණ කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව යන ආයතනවල නිලධාරිහු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මීළඟ කාරක සභා රැස්වීම ලබන 07 වැනිදා පැවැත්වීමට නියමිත බව කාරක සභාවේ ලේකම්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය මෙහිදී පැවසුවාය.



පුවත්

# වී ගොවියා සහ පාරිභෝගිකයා සුරැකෙන පරිදි තීරණ ගැනීමට නිලධාරීන් සමත් විය යුතුයි - රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නිලධාරීන්ට අවධාරණය කරයි

පසුගිය අප්‍රේල් මස පැනවූ ආනයන තහනම නිමා කරමින්, සහල් ආනයනයට නැවතත් අවසර ලබාදෙන්නේ නම්, ඉදිරියට පැමිණෙන යල කන්නයේ වී අස්වැන්න පිළිබඳව නිසි පුරෝකථනයක් කිරීමෙන් අනතුරුව පමණක් එය සිදු කළ යුතු බව පසුගිය දෙසැම්බර් 01 රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් විසින් නිර්දේශ කෙරිණ.



මෙහිදී, මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා පෙන්වා දුන්නේ, පවතින සුවිශේෂී තත්ත්වයන් යටතේ දේශීය වී ගොවියාට සිය අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබාදීම මෙන්ම පාරිභෝගිකයාට සාධාරණ මිලකට, ගුණාත්මක භාවයෙන් හෙබි සහල් පරිභෝජනයට අවස්ථාව සලසා දීම සඳහා මේ තත්ත්වය තාර්කිකව විශ්ලේෂණය කර, පුරෝකථනවලට එළඹිය යුතු බවය.

එහිදී ආනයන අපනයන අධ්‍යක්ෂ ජනරාල්වරිය පිළිතුරු දෙමින් සභාව හමුවේ අනාවරණය කර සිටියේ දැනට ලැබී ඇති දත්ත අනුව, අපේක්ෂිත යල අස්වැන්න ගියවර මෙන් මෙවරද 2/3ක් පමණක් වීමට ඉඩ ඇති බවයි. එම අවස්ථාවේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් ප්‍රනාන්දු මහතා කාරක සභාවට පෙන්වා දුන්නේ, මෙසේ බලපත්‍ර රහිතව සහල් ආනයනයට ඉඩදීම මඟින් ලංකාවේ පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණයට වඩා සහල් ආනයනයට ව්‍යාපාරිකයන් පෙළඹීම හේතුවෙන් දේශීය ගොවියා අසීරුතාවයන්ට මුහුණ පෑම වැළැක්වීමට මුදල් අමාත්‍යාංශය මැදිහත් විය යුතු බවයි. නිදර්ශනයක් වශයෙන් ඉන්දියාව හා සන්සන්දනය කර බැලීමේදී සෑම ආර්ථික මට්ටමකම පුරවැසියන්ට අඩු මිලට මිලදී ගත හැකි සහල් වර්ගයක් දේශීය වෙළඳපොළේ තිබීම වැදගත් බවද හෙතෙම මුදල් අමාත්‍යාංශ නිලධාරීන් හට පෙන්වා දුන්නේය.





මුදල් අමාත්‍යවරයාගේ නියමය පරිදි කැකුළු, නාඩු, සම්බා ඇතුළු සහල් වර්ග ආනයනය සඳහා අවසර ලබාදෙන අතිවිශේෂ ගැසට් පත්‍රයක් සඳහා අනුමතිය ලබාගැනීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අවධාරණය කරන ලදී. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පවසා සිටියේ  නිවැරදි සහ තාර්කික තක්සේරුවකින් තොරව මෙවන් නියෝග වලට එළඹීම මඟින් ඇතිවන සාර්ව බලපෑම සම්බන්ධව මීට වඩා නිලධාරීන් විමර්ශනාත්මකව කටයුතු කිරීම අවශ්‍ය වන බවයි.

එසේම සහල් වෙළඳපොළ සම්බන්ධව පාරිභෝගික අයිතීන් පිළිබඳව කටයුතු කරන පාරිභෝගික කටයුතු අධිකාරිය මීට වඩා සක්‍රීය ලෙස ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව සහ දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ සහල් ව්‍යාපාරිකයන් ශක්තිමත් කිරීමට වැඩපිළිවෙළක් යෙදීමේ වැදගත්කම කාරක සභාවේදී සාකච්ඡාවට ලක්විණි.

මීට අමතරව, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව විසර්ජන පනත් කෙටුම්පත රජයේ ප්‍රතිපත්තීන්ට කෙතරම් දුරට අනුකූල වන්නේද යන්න පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන වාර්තාව හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ද කාරක සභාවෙහි අනුමතිය පළවිණි.

මෙහිදී කාරක සභාව හමුවට පැමිණ සිටි මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විමසා සිටියේ 2021 අයවැය පුරෝකථන සපුරාගැනීමට හැකිවූයේද යන්නයි. මුදල් අමාත්‍යංශ නිලධාරීන් ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන හා දත්ත අනුව කාරක සභාවට නිරීක්ෂණය වන්නේ සියලුම ණය පියවා ගැනීමට දේශීය අරමුදල් පමණක් භාවිත කරන්නේ නම්, නුදුරු අනාගතයේදී පොලී අනුපාත ඉහළ යාමක් බවත් එය දේශීය පෞද්ගලික කර්මාන්ත කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති බවද මෙහිදි ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පෙන්වා දුන්නේය.

**පුවත්**

# 2022 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතට කථානායකවරයා සිය සහතිකය සටහන් කරයි



*2022 ජනවාරි 01 දිනයෙන් ආරම්භ වී 2022 දෙසැම්බර් 31 දින අවසන් වන මුදල් වර්ෂය වෙනුවෙන් ආණ්ඩුවේ වියදම් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ විසර්ජන පනත් කෙටුම්පතට ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සහතිකය දෙසැම්බර් 10 වැනිදා හිමිවිණි.*

මෙම පනත් කෙටුම්පත පළමුවර කියවීම සඳහා පසුගිය ඔක්තෝබර් 7 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. ඉන් අනතුරුව පසුගිය නොවැම්බර් 12 වැනි දින ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා විසින් විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා ( අයවැය කථාව ) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි.

මේ අනුව දින හතක විවාදයක් පැවැත්වීමෙන් අනතුරුව නොවැම්බර් 22 දින දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම පැවැත්වුණ අතර එය වැඩි ඡන්දයෙන් සම්මත විය. ඊට පක්ෂව ඡන්ද 153 ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 60 ක් ලැබුණි.

ඉන් අනතුරුව නොවැම්බර් 23 දින සිට දෙසැම්බර් 10 වැනි දින දක්වා පැවති කාරක සභා අවස්ථාවේදී එක් එක් අමාත්‍යාංශවල වැය ශීර්ෂය විවාදයට ගැනීම හා සම්මත කිරීම සිදු විය. මේ අනුව තෙවැනි වර කියවීමේ ඡන්ද විමසීම පැවැත්වුණු අතර එහිදී සංශෝධන සහිතව විසර්ජන පනත් කෙටුම්පත වැඩි ඡන්දයෙන් සම්මත විය. ඒ අනුව විසර්ජන පනත් කෙටුම්පතට පක්ෂව ඡන්ද 157 ක් ලැබුණු අතර විපක්ෂව ඡන්ද 64 ක් ලැබුණි.

විශේෂාංග

# නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ කාරක සභා ක්‍රමය



**මැතිවරණ පැවැත්වීම**

නූතන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය තුළ ජනතා නියෝජිතයන් තෝරා පත් කිරීම සඳහා මැතිවරණ ක්‍රම දෙකක් භාවිතයට ගනී. එනම්,

1. සරල බහුතර නියෝජන  ක්‍රමය.
2. සමානුපාතික නියෝජන ක්‍රමය.

මැතිවරණයකදී තරග කරන ආසනයෙන් බහුතර ඡන්ද සංඛ්‍යාවක් හිමිකර ගනු ලබන තැනැත්තා ජයග්‍රාහී අපේක්ෂකයා ලෙස නම් කිරීම සරල බහුතර නියෝජන ක්‍රමයේ පදනම වේ. මෙම සරල බහුතර නියෝජන ක්‍රමය ක්‍රියාවට නංවනු ලබන්නේ ප්‍රාදේශීය වශයෙන් බෙදන ලද මැතිවරණ කොට්ඨාස ක්‍රමයක් පදනම් කර ගෙනය. මේ අනුව මුළු භූමි ප්‍රමණය යම් ඡන්ද කොට්ඨාස නැති නම් ආසන සංඛ්‍යාවකට බෙදනු ලැබේ. එසේ බෙදනු ලබන්නේ නිශ්චිත වශයෙන් තීරණය කරන ලද යම් ජන සංඛ්‍යාවක් සහ භූමි ප්‍රමාණයක් පදනම් කරගෙනය.

ජනගහනයේ වැඩි වීම අනුව කාලයෙන් කාලයට ආසන යළි සකස් කරනු ලැබේ. සාමාන්‍ය ක්‍රමය වන්නේ අලුතින් ගනු ලබන ජන සංඛ්‍යා ලේඛනයක් පදනම් කර ගෙන ආසන බෙදීමයි. සාමාන්‍යයෙන් සෑම අවුරුදු 10කට වරක්ම ජන සංඛ්‍යා ලේඛනය සකස් කරන බැවින් ඒ අනුව සෑම අවුරුදු 10කට වරක්ම මැතිවරණ කොට්ඨාස යළි බෙදන බව මේ අනුව සිතා ගත හැක. මේ ක්‍රමය යටතේ එක් ආසනයකින් තෝරා ගනු ලබන්නේ එක් මන්ත්‍රීවරයෙකු පමණි. මෙම ආසන තනි මන්ත්‍රී ඡන්ද කොට්ඨාස වශයෙන් හඳුන්වනු ලැබේ. නමුත් සමහර විට එක් මන්ත්‍රීවරයෙකුට වඩා තෝරාගන්නා අවස්ථාද ඇත. එවැනි ආසන බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ලෙස හැඳින්වේ. මේ අනුව තනි මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයක් නම් ඡන්දදායකයකුට එක් ඡන්දයක්ද, බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයක් නම් තෝරා ගන්නා මන්ත්‍රීන් සංඛ්‍යාවට සමාන ඡන්ද ප්‍රමාණයක්ද ඡන්ද දායකයෙකුට හිමි වේ. බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයකදී තමන් කැමති අපේක්ෂකයකුට අවශ්‍ය නම් තමාගේ සියලු ඡන්ද ප්‍රකාශ කළ හැකිය. නැති නම් තමන්ගේ කැමැත්ත අනුව කීප දෙනෙකුට වුවද ප්‍රකාශ කළ හැකිය.

බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව සහ ඉන්දියාව යන රටවල නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නියෝජිතයන් තෝරා පත් කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතයට ගැනේ. ලෝකයේ තවත් රටවල් රාශියක් මෙම ක්‍රමය භාවිතයට ගෙන ඇත. ශ්‍රී ලංකාවද 1931 - 1947 දක්වා කාලය තුළදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජිතයින් තෝරා පත් කර ගැනීම සඳහාත් සරල බහුතර නියෝජන ක්‍රමය යොදා ගැනිණි.

**සමානුපාතික නියෝජන ක්‍රමය**

මෙම ක්‍රමයේ මූලික අරමුණ වන්නේ මැතිවරණයකදී සෑම දේශපාලන පක්ෂයක් මෙන්ම කණ්ඩායමක් ලබා ගන්නා ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව වන අයුරින් නියෝජනයක් ලබා දීමයි. සරල බහුතර නියෝජන ක්‍රමයේ අඩු පාඩු මඟ හරවා සැබෑ බහුතර මතය පිළිබිඹු කිරීමේ මර්ගයක් ලෙස සමානුපාතික නියෝජන ක්‍රමය ඉදිරිපත් කර ඇත. මෙම ක්‍රමය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වන බව බොහෝ විචාරකයෝ පවසති.



සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාවට නංවන ක්‍රම කීපයක් තිබෙන අතර ඒ අතුරන් වඩාත්ම ප්‍රචලිත ක්‍රමය දෙක වන්නේ හේයාර් ක්‍රමය සහ ලැයිස්තු ක්‍රමයයි.

**හේයාර් ක්‍රමය**

ඉංග්‍රීසි ජාතික නීතිවේදයකු වූ තෝමස් හේයාර් විසින් 1859 දී මෙම ක්‍රමය ඉදිරිපත් කරනු ලැබේ. සරල බහුතර නියෝජන ක්‍රමය පවතින දුර්වලතා මග හැරවීම අරමුණු කර ගෙන ඔයු විසින් ඉදිරිපත් කරන ලද මෙම ක්‍රමය STV ක්‍රමය හෙවත් මාරු කළ හැකි තනි ඡන්ද ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. මේ අනුව වරණ ක්‍රමයක් යටතේ ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාව ඡන්ද දායකයාට හිමි වේ. මෙම ක්‍රමය යටතේ මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගන්නේ පහත සඳහන් ආකාරයටය :-

1. ජයග්‍රහණය සඳහා අවශ්‍යයැයි නියමිත ඡන්ද සංඛ්‍යාව හෝ එයට වැඩි ප්‍රමණයක් හෝ ලබාගත් අපේක්ෂකයන් ජයග්‍රාහී අපේක්ෂකයන් ලෙස සැලකනු ලැබේ.

2. ඉහත දැක්වූ පළමු ක්‍රමය යටතේ යම් ඡන්ද කොට්ඨාසයකින් නියමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තේරී පත් වී නොමැති නම් පළමුවෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් විසින් ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් ලබා ගෙන ඇති ඡන්දවල දන්වා ඇති වරණ හෙවත් මනාප පහළින් සිටින අපේක්ෂකයන් අතරේ බෙදා හැරීම.

3. දෙවැනි අවස්ථාවේ මනාප බෙදා හැරීමෙන් පසුවත් නියමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තේරී පත් වී නොමැත්තේ නම් අපෙක්ෂක ලයිස්තුවේ අඩුවෙන්ම ඡන්ද ලබා ගත් අපේක්ෂකයන් අනුක්‍රමයෙන් ලැයිස්තුවෙන් ඉවතට ගනිමින් ඔවුන් ලබා ඇති ඡන්දවල දක්වා ඇති මනාප ලකුණු කර ඇති ආකාරය ඉහළින් සිටින අපේක්ෂකයන් අතර බෙදා හැරීම.

හේයාර් ක්‍රමය ක්‍රියාවට නැංවීමට මූලධර්ම පහත සඳහන් පරිදි වේ :-

(අ). තනි මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය වෙනුවට බහු මන්ත්‍රී මැතිවරණ දිස්ත්‍රික්ක ක්‍රමය ක්‍රියාත්මක වීම. නිදසුනක් ලෙස කලින් එක් මැතිවරණ දිස්ත්‍රික්කයක් ආසන පහකට බෙදා තිබුණේ නම් එය දැන් එක් මැතිවරණ දිස්ත්‍රික්කයක් ලෙස සැලකීම.

(ආ). මැතිවරණ දිස්ත්‍රික්ක තුළින් තෝරා පත් කර ගන්නා මන්ත්‍රීන් සංඛ්‍යාවට සමාන වරණ හෙවත් මනාප ඡන්ද දායකයාට හිමි වීම. නිදසුනක් ලෙස මැතිවරණ දිස්ත්‍රික්කයෙන් තෝරාගැනීමට නියමිත මන්ත්‍රීන් සංඛ්‍යාව පහක් වන්නේ නම් ඡන්ද දායකයාට තම වරණය සිය මනාපය අනුව අපේක්ෂකයන් පස් දෙනෙකුට ප්‍රකාශ කළ හැකිය.

(ඇ). මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වීමට අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව තීරණය කිරීම. මෙය තීරණය කරන්නේ අදාළ මැතිවරණ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයෙන් තෝරපත්කර ගැනීමට නියමිත මන්ත්‍රී සංඛ්‍යාවට එකක් එකතු කිරීමෙන් බෙදා එන සංඛ්‍යාවට තවත් එක් අතිරේක ඡන්දයක් එකතු කිරීමෙනි.

(ඈ). ඉහතින් දක්වන ලද (අ), (ආ) සහ (ඇ) අනුව නියමිත මන්ත්‍රී සංඛ්‍යාව පත් කිරීම.

(ඉ). මෙම ක්‍රමය අනුව දේශපාලන පක්ෂ අනුව පමණක් නොව ස්වාධීනවද අපේක්ෂකයන්ට තරග කළ හැකිය.

**ලැයිස්තු ක්‍රමය**

සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන දෙවැනි ක්‍රමය මෙය වේ. මෙහිදී ඡන්දදායකයා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂයටය. ඡන්ද දායකයාට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි. මනාප ඡන්ද හිමි නොවේ. පක්ෂය මඟින් මැතිවරණය සඳහා අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය. මෙයද බහු මන්ත්‍රී මැතිවරණ දිස්ත්‍රික්ක ක්‍රමය පදනම් කර ගෙන ක්‍රියාත්මක වන්නකි. පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත් වීම සඳහා නියමිත ඡන්ද සංඛ්‍යාවෙන් බෙදීමෙන් පක්ෂයට හිමි ආසන සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ අතිශය වැදගත්කමක් හිමි වේ. ලැයිස්තුවේ සඳහන් අපේක්ෂකයන් අතුරින් ඉහළ සිට පහළට නම් දක්වා ඇති ආකාරයට මන්ත්‍රීවරුන් නම් කිරීම සාමාන්‍ය ක්‍රමයයි. නමුත් එය රටෙන් රටට වෙනස්වන අවස්ථාද දැකිය හැකිය.

ඉහත දැක්වූ හෙයාර් ක්‍රමය යටතේ මෙන්ම ලැයිස්තු ක්‍රමය යටතේද මැතිවරණ දිස්ත්‍රික්ක සඳහා අපේක්ෂක ලැයිස්තුව ඉදිරිපත් කිරීමේදී තෝරා පත් කර ගැනීමට නියමිත මන්ත්‍රීන් සංඛ්‍යාවට අතිරේකව තවත් අපේක්ෂකයන් තිදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.

*එන්. එච්. එම් ජානක*
*ආහාර පාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව*
*ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව*

# පළාත් පාලන ගැටලු සාකච්ඡා කිරීමට පළාත් පාලන කොමසාරිස්වරු සහ ආණ්ඩුකාරවරු ඉදිරියේදී කැඳවනවා - අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා



පළාත් පාලන ආයතනවලට අය වැය සම්මත කිරීමකින් තොරව ඉදිරි වර්ෂය සඳහා මුදල් දැරීමේ කිසිඳු හැකියාවක් නොතිබුණද අම්බලන්ගොඩ නගර සභාව 2021 වර්ෂය සඳහා අයවැය සම්මත කරගැනීමකින් තොරව මුදල් වියදම් සිදුකරන බව පසුගිය දෙසැම්බර් 02 පාර්ලිමේන්තුවේදී පැවති රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සාකච්ඡා විය.

එය නීතිවිරෝධී බැවින් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ආණ්ඩුකාරවරයා දැනුවත් කිරීමෙන් පසු පළාත් පාලන ආයතනය විසුරුවා හැරීමේද හැකියාව පවතින බව මෙහිදී අනාවරණය විය. මෙම තත්ත්වය මේ වන විට වෙනත් පළාත් පාලන ආයතනයන් කිහිපයක ද සිදුවන බව පැමිණ සිටි මන්ත්‍රීවරු පැවසුහ.

මෙය වැරදි පූර්වාදර්ශයක්ද වන බැවින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතු කරන බව පැවසූ අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා පළාත් පාලන ආයතන සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරු සහ ආණ්ඩුකාරවරු ඇතුළු වගකිවයුතු නිලධාරීන් ඉදිරියේදී මෙම කාරක සභාවට කැදවීමට අපේක්ෂා කරන බවද පැවසීය.

මෙම කරුණු අනාවරණය වූයේ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු රොෂාන් රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙනි දෙසැම්බර් 02 පාර්ලිමේන්තුවේදී පැවති රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීය.



පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති අවසන් කිරීමට ඇති කාලය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවද මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. සිමෙන්ති හිඟය, පැවති කොවිඩ් තත්ත්වය වැනි හේතු නිසා ව්‍යාපෘති අදාළ කාලය තුළ අවසන් කිරීමට නොහැකිව ඇති බැවින් එම කාලය ලබන වසරේ ජනවාරි දක්වා හෝ දීර්ඝ කළ යුතු බව මෙහිදී සාකච්ඡා විය. මේ පිළිබඳව කඩිනමින් සාකච්ඡා කර තීරණයක් ගන්නා බව අමාත්‍යවරයා පැවසීය.

පළාත් පාලන ආයතන යටතේ ඇති ක්‍රීඩාංගණ ආදී දේපළ නිසි පරිදි නඩත්තු නොකිරීම පිළිබඳවද මන්ත්‍රීවරු කාරක සභාවේ අවධානය යොමු කළහ. පළාත් පාලන ආයතන මඟින් එම කටයුතු නිසි පරිදි සිදුවනවා දැයි සොයා බැලීම සඳහා මසකට වරක් හෝ රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීම සඳහා මැදිහත් වන ලෙස අමාත්‍යවරයා මෙහිදි අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

පළාත් සභා අක්‍රියව පවතින නිසා පළාත් පාලන ආයතන පරිපාලනය සඳහා පළාත් පාලන ආයතනවල මුදල් පරිපාලනය සඳහා පළාත් පාලන කොමසාරිස්වරු කටයුතු නොකිරීම නිසා රේඛීය අමාත්‍යාංශය මඟින් මෙය නියාමනය සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයද පෙන්වා දුන්නේය.

පවතින කොවිඩ් තත්ත්වය නිසා පළාත් පාලන ආයතනවල ආදායම ශීඝ්‍ර ලෙස අඩු වී ඇති බව කාරක සභාවේදී සාකච්ඡා විය. වරිපනම් බදු අය කරගැනීමේදී තක්සේරුකරණය සඳහා සේවක සංඛ්‍යාව අඩුවීම නිසා ලැබෙන ආදායම සත්‍ය වශයෙන් ලැබිය යුතු ආදායමට වඩා බෙහෙවින් අඩුවී ඇති බව මන්ත්‍රීවරු කමිටුවේ අවධානයට යොමු කළහ. එසේම නගර සභාවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ඖෂධවේදීන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ හිඟය ආදී ගැටලු රැසක් පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. අලුතින් බදවාගත් උපාධිධාරීන් පළාත් පාලන ආයතනවලට යොමු කිරීමට පියවරගන්නා බවත් මෙම ගැටලු හඳුනාගෙන ඇති බැවින් ඊට කඩිනමින් විසඳුම් ලබා දීමට පියවර ගන්නා බවත් අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී පැවසීය.



කාරක සභා සාමාජිකයන් වන ශාන් විජේලාල් ද සිල්වා, සුදත් මංජුල ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් රැසක්ද  රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා ඇතුළු නිලධාරීහුද මෙම අවස්ථාවට එක්ව සිටියහ.



# ඇ.ඩො. 3000 දක්වා මැණික් ඇණවුම් ඔන්ලයින් මඟින් සිදු කිරීමේ ගැසට් පත්‍රයට කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය



**වටිනාකම ඇ.ඩො 3000 දක්වා වන මැණික් අලෙවි කිරීමේ ඇනවුම්, මාර්ගගත (ඔන්ලයින්) ක්‍රමවේදයට සිදුකිරීමට අදාළ ගැසට් පත්‍රයට කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුමතිය පසුගියදා (06) හිමිවිය.**

පවතින කොවිඩ් තත්ත්වය මත සංචරණ කටයුතු සීමා වීම නිසා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා මෙම පියවර ගෙන ඇති බව මෙහිදී අනාවරණය විය. එසේම, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් අයකරනු ලැබූ සියයට 0.5ක ගාස්තුව සියයට 0.25 දක්වා අඩු කිරීමද මෙම ගැසට් පත්‍රය මඟින් සිදුකර ඇත.

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ඇතුළත් අංක 2165/2 දරන ගැසට් පත්‍රයට මෙලෙස කාරක සභාවේ අනුමතිය හිමිවිය.

කර්මාන්ත කටයුතු අමාත්‍ය ගරු විමල් වීරවංශ, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ සහ බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ඊයේ (06) පැවති කාරක සභා රැස්වීමට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජනරාල් දයා රත්නායක මහතා ඇතුළු නිලධාරීහු සහභාගී වූහ.

රත්නපුර 'වේගඟ' ආශ්‍රිතව මැණික් ගැරීම සඳහා දියත් කළ ව්‍යාපෘතිය, ඇති වූ විරෝධයක් හේතුවෙන් දැනට නතරවීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. මේ අනුව විශේෂ සංවර්ධන කමිටු රැස්වීමකදී මේ පිළිබඳව සාකච්ඡා කර රටටත් විශාල ආදායමක් හිමිවන මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්තේ මහතා පෙන්වා දුන්නේය.

ඇළහැර ප්‍රදේශයේ මැණික් බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් ඇති කිරීමෙන් සාමාන්‍ය ජනතාවටද මැණික් ගැරීමේ ව්‍යාපාරයට සම්බන්ධ වීමට පවතින හැකියාව පිළිබඳ මෙහිදී සාකච්ඡා විය. ලබන ජනවාරියේ සිට මෙම බලපත්‍ර නිකුත් කිරීම සිදුකරන බව රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

දිවයිනේ විවිධ කර්මාන්තපුරයන් සහ කර්මාන්තයන් ආශ්‍රිතව ඇති ගැටලු පිළිබඳවද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කමිටුවේ අවධානය යොමු කළහ. අදාළ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් ඒවාට කඩිනම් විසඳුම් ලබා දීමට කටයුතු කරන ලෙසත් නොඑසේනම් ඒ පිළිබඳව ඉදිරි කාරක සභාවට අදාළ සවිස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරන ලෙසත් අමාත්‍යවරයා අදාළ නිලධාරීන්ට මෙහිදී උපදෙස් ලබා දුන්නේය.







පුවත්

# රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් 06 දෙනෙකුගේ සහ මහකොමසාරිස්වරයෙකුගේ පත්වීම් සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් 06 දෙනෙකුගේ සහ එක් මහ කොමසාරිස්වරයෙකුගේ පත්වීම් සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමතිය පසුගියදා හිමි වූ බව මහ ලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ දී පහත නම් සඳහන් මහකොමසාරිස්වරයාට සහ ලේකම්වරුන්ට කාරක සභා අනුමතිය හිමිව තිබේ :-

දකුණු අප්‍රිකාවේ මහ කොමසාරිස්වරයා ලෙස මහාචාර්ය ගාමිණී ගුණවර්ධන මහතාට අනුමතිය ලබා දී ඇත.

- සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එම්. එන්. බී. හපුහින්න මහතා
- ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස ඩී. ඩී. මාතරආරච්චි මහතා
- සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස ජේ. එම්. තිලකරත්න බණ්ඩා මහතා
- ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එස්. ටී. කොඩිකාර මහතා
- දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස එස්. එච්. හරිස්චන්ද්‍ර මහතා
- සූර්යබල, සුළං හා ජල විදුලිජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කේ. එච්. ඩී. කේ. සමරකෝන් මහතා

මෙම රැස්වීමට අමාත්‍යවරුන් වන දිනේෂ් ගුණවර්ධන, ඩග්ලස් දේවානන්දා, කෙහෙළිය රඹුක්වැල්ල, රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් සෙනෙවිරත්න යන මහත්ම මහත්මීහු සහභාගි වූහ.

පුවත්

# විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය ස්වාධීනත්වය සුරකිමින් පරිපාලනමය හා ප්‍රතිපාදනමය මැදිහත්වීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මුල් විය යුතුයි - කෝප් කමිටුව

**ශාස්ත්‍රීය කරුණු සම්බන්ධව විශ්ව විද්‍යාල වලට ඇති ස්වාධීනත්වය ආරක්ෂා කරමින් පරිපාලනමය හා ප්‍රතිපාදනමය මැදිහත්වීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූලික විය යුතු බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) සභාපති මහාචාර්ය චරිත හේරත් මහතා පසුගියදා (08) නිර්දේශ කළේය.**




විශ්වවිද්‍යාල පනත යටතේ අධ්‍යයන නිදහසක් ලබාදී තිබුණද අනධ්‍යයන අංශ පරිපාලන රෙගුලාසි හා නීතිරීතිවලට අනුගත විය යුතු බව කෝප් සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය. ඇතැම් විශ්ව විද්‍යාල පශ්චාත් උපාධි අධ්‍යයන අංශ ආදිය මඟින් මුදල් උපයන බැවින් ඇතැම් අනධ්‍යයන සේවක බඳවා ගැනීම් තම අභිමතය පරිදි සිදු කිරීමේ ප්‍රවණතාවක් පවතින බවත්, එය එසේ නොවියයුතු බවත්, මෙහිදී අවධාරණය කෙරිණි. එබැවින් මෙම තත්ත්වය පිළිබඳ අවධානයෙන් පසුවන ලෙස ද කෝප් සභාපතිවරයා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට උපදෙස් ලබා දුන්නේය.

1996 වසරේ නිකුත් කරන ලද කැබිනට් තීරණයක් මත විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පහළ තනතුරුවල බඳවා ගැනීමේදී ඇතිවී තිබෙන ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. පුවත්පත් දැන්වීම් හරහා අයදුම්පත් කැඳවීම මඟින් සහ අමාත්‍යවරයාගේ යෝජනාව අනුවද මෙම බඳවා ගැනීම් සිදු කළ හැකි බව සඳහන් බව මෙහිදී අනාවරණය විය.

1996 දී ලබා දුන් මෙම කැබිනට් තීරණය අනුව සමස්ත විශ්ව විද්‍යාල පද්ධතියේම පහළ අනධ්‍යයන සේවකයන් බඳවා ගැනීම සිදුවන බැවින් මෙම තත්ත්වය නිවැරදි විය යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා පැවසීය. ඒ අනුව මෙම කැබිනට් තීරණය වෙනස් කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කිරීමේ හැකියාව ඇති බව කෝප් සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය. මේ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව තීරණයක් ගන්නා ලෙස කෝප් සභාපතිවරයා නිර්දේශ කළේය.

2019 වර්ෂයට අදාළ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය පිළිබද විමර්ශනය සඳහා මහාචාර්ය චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (08) පැවති කෝප් කමිටු රැස්වීමේදී මෙම කරුණු අනාවරණය විය.

Z අගය මත විශ්ව විද්‍යාලයට ඇතුළත් කරගන්නා පිරිසට බාහිර විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අභියෝගතා පරීක්ෂණ මඟින් ඇතුළත් කර ගැනීම අනවශ්‍ය බව තීරණය කරන්නේ නම් එය අහෝසි කිරීමට හෝ අවම කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස ද කෝප් කමිටුව නිර්දේශ කළේය.

2012 වසරේදී විශේෂ කැබිනට් අනුමතියකට අනුව විශ්ව විද්‍යාල 13 ක, පාඨමාලා 38ක් සඳහා සිසුන් බදවා ගැනීමට අභියෝගතා පරීක්ෂණ ක්‍රමය හඳුන්වා දී ඇති බවද මෙහිදී අනාවරණය විය. එම පාඨමාලා සඳහා වෙනම අදාළ විශ්ව විද්‍යාල මඟින් ඇතුළත් වීමේ පරීක්ෂණ පැවැත්වීම සිදු කෙරේ.

මෙහිදී අදහස් දක්වමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පවසා සිටියේ මෙසේ තෝරා ගන්නා පාඨමාලා ප්‍රමාණය අවශ්‍ය පරිදි අඩු කිරීම හෝ අහෝසි කිරීම සිදු කළ යුතුයි යන්න සිය මතය බවයි. මෙම පරීක්ෂණ ක්‍රමය නිසා Z අගය මත සිසුන් විශ්ව විද්‍යාලයට ඇතුළත් කිරීමේ ජාතික ප්‍රතිපත්තියට යම් හානියක් සිදුවන බව පෙනී යන බැවින් මේ පිළිබඳ සුදුසු තීරණයක් ගන්නා ලෙස මෙහිදී කෝප් සභාපතිවරයා පෙන්වා දුන්නේය.

ඇතැම් පාඨමාලා සදහා මෙසේ පරීක්ෂණයක් පැවැත්වීම අනවශ්‍ය බව මේ වන විට හඳුනාගෙන ඇති බැවින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ බව විශ්ව විද්‍යාලවලට දක්වා ඇති බවද අනාවරණය විය. නව පාඨමාලා ඉදිරිපත් කරන විට ඒ සඳහා අභියෝගතා පරීක්ෂණවලට අවසර ලබා නොදෙන බවද මෙහිදී අදහස් දක්වමින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා මෙහිදී පැවසීය.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ 03/2021 දරන චක්‍රලේඛය නිසා ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. විශ්වවිද්‍යාල උප කුලපතිවරුන් පත් කිරීමේදී වඩාත් පාරදෘශ්‍ය ක්‍රමවේදයක් අවශ්‍ය බැවින් රාජ්‍ය ප්‍රතිපත්තිවලටද ගරු කරමින් විශ්වවිද්‍යාල නිදහසද ආරක්ෂා කර ගනිමින් කටයුතු කළ යුතු බව කෝප් සභාපතිවරයා පැවසීය. උක්ත චක්‍රලේඛය සම්බන්ධව මතුවී ඇති ව්‍යාකූලතා පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා, ලේකම්වරයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා අතර සාකච්ඡා කොට අවශ්‍ය වෙනසක් වෙතොත් සිදු කිරීම සුදුසු බව කෝප් සභාපතිවරයා පැවසීය.

තවද 2009 - 2017 දක්වා කාලයේ පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ප්‍රතිලාභින් ලෙස විශ්ව විද්‍යාල ආචාර්යවරුන් 13 දෙනෙකුට රුපියල් මිලියන 25ක් ලබා දී තිබුණද ඔවුන් මේ වන විට උපාධි පාඨමාලා අතහැර දමා තිබීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. එසේම 2017 වසරේදී විශ්ව විද්‍යාල 8ක කථිකාචාර්යවරු 12 දෙනෙකු රු. මි. 34.3ක මුදලක් පර්යේෂණ සඳහා අනුමත කරගෙන තිබුණ ද එය භාවිතයට ගෙන නැති බවද මෙහිදී අනාවරණය විය.

පසුගිය කාලය තුළ ආචාර්ය උපාධිය හදාරා ඇති 15 දෙනෙකු විශ්ව විද්‍යාලවලින් ඉවත් වී ඇති බවද අනාවරණය විය. මෙවැනි තත්ත්වයක ඔවුන්ට විරුද්ධව නීතිමය කටයුතු කිරීමේ වැදගත්කම කෝප් සභාපතිවරයා පෙන්වා දුන්නේය.

2020 වසරේදී ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කොට උසස් අධ්‍යාපනය සඳහා වෙනම අනු කමිටුවත් පත් කළ බවත් සියලුම විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් එක්වී විශ්වවිද්‍යාලවල ඉදිරි ගමන් මග කෙසේද යන්න සවිස්තරාත්මකව වාර්තා කළ බවත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපතිවරයා මෙහිදී පැවසීය. වඩාත් වැදගත් වන්නේ මෙය පදනම් කරගෙන උපාය මාර්ග 09 ක් ඔස්සේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් මඟින් ඉදිරියට යෑම ආරම්භකර තිබීම බව කොමිසමේ සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය. මෙය ජාතික වටිනාමකින් යුතු වැඩපිළිවෙළක් බැවින් එය පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ද ඉදිරිපත් කර වඩාත් ශක්තිමත්ව ස්ථාපිත කිරීමට අවස්ථාව ලබා දීම සුදුසු බව කෝප් සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

නවක වදය අවම කිරීම සඳහා රුපියල් මිලියන 34ක් වියදම්කොට විශ්වවිද්‍යාලවල පිහිට වූ මධ්‍යස්ථානවල ප්‍රගතිය පිළිබඳවද කෝප් කමිටුව කරුණු විමසන ලදී. 2015 වසරේදී පිහිටුවා ඇති මෙමඟින් නවකවදය සම්බන්ධ පැමිණිලි වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් අන්තර්ගතවන බව කරුණු අනාවරණය විය. මේ සම්බන්ධව එක් එක් විශ්වවිද්‍යාල මට්ටමින් මෙහි ක්‍රියාකාරීත්වය කෙතරම් ඵලදායි වන්නේද යන්න සොයා බලා වාර්තාවක් කෝප් කමිටුවට මසක් තුළ ලබා දෙන ලෙසත් මහාචාර්ය චරිත හේරත් මහතා නිර්දේශ කළේය.

ගරු අමාත්‍යවරුන් වන මහින්ද අමරවීර, සරත් වීරසේකර,  ගරු රාජ්‍ය අමාත්‍යවරුන් වන සුසිල් ප්‍රේමජයන්ත, ඉන්දික අනුරුද්ධ, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රවුෆ් හකීම්, ජයන්ත සමරවීර, ජගත් පුෂ්පකුමාර සහ මධුර විතානගේ යන මහත්වරුද මෙම අවස්ථාවට සහභාගී වූහ.



පුවත්

# පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජයසංකේත සහ සහතික පත් ප්‍රදානය කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන්

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලියේ ජය සංකේත සහ සහතික පත් ප්‍රදානය ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ බිලියඩ් ශාලාවේදී පසුගියදා (09) පැවැත්විණ.**



අංශ 05ක් යටතේ පැවැත්වුණු තරඟාවලියේ දාම් තරඟ අංශයේ ශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්. එච්. එම්. ධර්මසේන මහතා දිනා ගත්තේය. එහි අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහණ බණ්ඩාර මහතා විසින් දිනා ගනු ලැබීය. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගයාශාන් නවනන්ද මහතා චෙස්, කැරම් සහ ස්නුකර් යන තරඟ අංශ 03හිම ශූරතාව දිනා ගැනීමට සමත්වීම විශේෂත්වයකි. මේස පන්දු තරඟ අංශයේ ශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වරුණ ලියනගේ මහතා දිනා ගත්තේය.



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලීන් බණ්ඩාර මහතා චෙස් සහ ස්නුකර් යන තරඟ අංශවල අනුශූරතාව දිනා ගැනීමට සමත් විය. කැරම් අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා දිනා ගත් අතර, මේස පන්දු අනුශූරතාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගයාශාන් නවනන්ද මහතා දිනා ගත්තේය.



පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්ෂික ක්‍රීඩා තරඟාවලිය මෙවර පැවැත්වුණේ දෙවැනි වරටය. ඩී. උපාලි ප්‍රේමචන්ද්‍ර, කේ. පී. ඊ. නන්දදේව, එච්. ජී අනුෂ්ක මධුරංග යන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ තරඟ විනිශ්චය කිරීමෙන් දායක වූහ.

ජය සංකේත සහ සහතික පත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරු ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසක්ද, පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු යන මහත්වරු ඇතුළු පිරිසක්ද එක්ව සිටියහ.



තරඟාවලිය සඳහා මූල්‍ය අනුග්‍රහය ලංකා බැංකුව සහ ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් සපයන ලදී. තරඟාවලියේ ප්‍රධාන සංවිධායක ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර මහතා කටයුතු කළේය.

# මැතිවරණයකට අදාළ වියදම් සම්බන්ධව "බලයලත් මුදලක්" තීරණය කිරීම යෝග්‍ය බව මැතිවරණ කොමිසම - පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී යෝජනා කරයි.



**මැතිවරණයකට අදාළ වියදම් සම්බන්ධව "බලයලත් මුදලක්" තීරණය කිරීම යෝග්‍ය බව මැතිවරණ කොමිසමේ සභාපති නීතිඥ නිමල් පුංචිහේවා මහතා මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී පසුගියදා (08) යෝජනා කළේය. මැතිවරණ වියදම් පාලනය පිළිබඳ සකසා ඇති පනත් කෙටුම්පතට එම තොරතුරු ඇතුළත් කර තිබේ.**

**දේශපාලන පක්ෂ සහ ඒ ඒ අපේක්ෂකයන්ට මැතිවරණයකදී වියදම් කළ හැකි මුදල් ප්‍රමාණය කෙතෙක්ද යන්නද යෝජිත බලයලත් මුදල තුළට අන්තර්ගත කෙරේ.**

මැතිවරණ කොමිසම විසින්, අදාළ දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කර එම බලයලත් මුදල තීරණය කෙරෙන බවද හෙතෙම කාරක සභාවේදී සඳහන් කළේය. එලෙස තීරණය කරන බලයලත් මුදල මැතිවරණයෙන් මැතිවරණයට වෙනස් විය හැකිය.

එම බලයලත් මුදල ඉක්මවා වියදම් කරන දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන්ට එරෙහිව දඬුවම් නියම කළ යුතු බවද මැතිවරණ කොමිසමේ සභාපතිවරයා කාරක සභාවේදී පෙන්වා දුන්නේය.



මෙහිදී අදහස් දැක්වූ කාරක සභාවේ සභාපති, සභානායක, අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පැවසුවේ තොරතුරු තාක්ෂණය සමඟ සිදු කෙරෙන මැතිවරණ ප්‍රචාරණ කටයුතු නියාමනය සඳහාද නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බවයි. ඊට නෛතික ප්‍රවේශයක් අවශ්‍ය අතර එය සාධාරණ හා නිදහස් මැතිවරණයකට ප්‍රමුඛ සාධකයක් වන බවද සභාපතිවරයා සඳහන් කළේය.

මැතිවරණ කාල සීමා තුළ දී සිදු කෙරෙන අල්ලස් ලබා දීම් පාලනය සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී රවුෆ් හකීම් මහතා කාරක සභාවේදී පැවසීය.

මැතිවරණ කාල සීමාව තුළදී සිදුවන ආපදා අවස්ථාවලදී පීඩාවට පත් පාර්ශ්වයන්ට සහන ලබාදීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් පැවතිය යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතා මෙහිදී කීවේය. එහිදී අදහස් දැක්වූ මැතිවරණ කොමිසමේ හිටපු සභාපති, සීමා නිර්ණය කොමිසමේ වත්මන් සභාපති මහින්ද දේශප්‍රිය මහතා පැවසුවේ, ආපදා අවස්ථාවලදී මැතිවරණ ප්‍රචාරණයක් සිදු නොවන අයුරින් සහන සැලසීම කිසිඳු ගැටලුවක් නොමැති බවයි. කොට්ඨාස ක්‍රමයේදී මැතිවරණ වියදම් පාලනය පහසු බව කාරක සභාවේදී අදහස් දැක්වූ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා පැවසීය.

මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේදී කොට්ඨාසවලින් පත්වන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සියයට 60ක් විය යුතු බවත්, සමානුපාතිකව තෝරා ගනු ලබන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සියයට 40ක් විය

යුතු බවත් මැතිවරණ කොමිසමේ සභාපතිවරයා මෙහිදී පවසා සිටියේය.

මැතිවරණයක් පැවැත්වීමට විශාල කාලයක් ගතවීම ගැටලුවක් බව පෙන්වා දුන් කාරක සභාවේ සභාපති, සභානායක අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා පැවසුවේ මැතිවරණ කාල සීමාව අඩු කිරීම ප්‍රායෝගික අවශ්‍යතාවක් බවයි.

එමෙන්ම මීළඟ කාරක සභා රැස්වීම ලබන 20 වැනිදා පැවැත්වීමට නියමිත බව කාරක සභාවේ ලේකම්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය මෙහිදී පැවසුවාය.

රාජ්‍ය අමාත්‍ය ගරු ජීවන් තොන්ඩමාන් මහතාද, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ සුමන්තිරන් මහතාද මෙම කාරක සභාවට සහභාගි වූහ.








## කර්තෘ මණ්ඩලය

| | |
|---|---|
| උපදේශනය | ධම්මික දසනායක මහතා<br>*(පාර්ලිමේන්තු මහලේකම්)* |
| | කුෂාණි රෝහණධීර මහත්මිය<br>*(නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලය ප්‍රධානී)* |
| | ටිකිරි කේ. ජයතිලක මහතා<br>*(සහකාර මහලේකම්)* |
| සංකල්පය | ශාන් විජේතුංග මහතා |
| අධීක්ෂණය | එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා<br>*(අධ්‍යක්ෂ - ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව/ සන්නිවේදන දෙපාර්තමේන්තුව)* |
| ප්‍රධාන සංස්කරණය | බුද්ධිනි රාමනායක<br>එදිරිවීර ගුණසේකර<br>නිම්මි හාතියල්දේණිය |
| මුල් කවරය ඡායාරූපකරණය | දුමින්ද වික්‍රමසිංහ |
| ඡායාරූපකරණය | නුවන් දුමින්ද |
| පිටු සැලසුම්කරණය | ඉෂාරා වික්‍රමසිංහ |
| අන්තර්ජාලය හරහා බෙදාහැරීම | ඩී. ජී. එම්. එම්. නුස්කි |

## දෙසැම්බර් 01

## ජපාන තානාපතිවරයා ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි...





## දෙසැම්බර් 08

## චීනයේ නියෝජ්‍ය තානාපති ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මුණගැසෙයි..






# පාර්ලිමේන්තු ඡායා ගැලරිය

## දෙසැම්බර් 15

## එක්සත් ජාතීන්ගේ සහකාර මහලේකම්වරිය ගරු කථානායකවරයා හමුවෙයි...







පාර්ලිමේන්තු විත්ති
පුවත් හසුන සඳහා දායක
වීමට ඔබටත් අවස්ථාව...,
"පාර්ලිමේන්තුව" තේමා
කරගත් මාතෘකා ඔස්සේ
ලිපි සම්පාදනයට ඔබටත්
අවස්ථාව පවතී.

සියලු ලිපි සෑම මසකම
15 වැනිදාට පෙර පහත
ඊමේල් ලිපිනයට යොමු
කරන්න.

sriparliament@gmail.com
විමසීම් - 0112 777 328


සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227



ISSN 2806-5425
9 772806 542008


Parliament of Sri Lanka
@ParliamentLK
@slparliament
Parliament of Sri Lanka